(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(4).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 ජූලි 22 බ්‍රහස්පතින්දා**

**2021 අගෝස්තු 03 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මුදල් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 19 දිනැති අංක 2224/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එම ගැසට් පත්‍රය සංශෝධනය කරමින් 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ 2021 ජූලි 06 දිනැති අංක 2235/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියෝග,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 20 දිනැති අංක 2228/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.07.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය අමාත්‍යතුමිය,— පරිපූරක මුදල — ශීර්ෂය 441 — වැඩසටහන 01 සහ 02 — † 2021 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එකොළොස් දහස් අටසිය හතලිස් තුනයි දශම හතයි (රු. 11,843,700,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත්, එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළයුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

**ශීර්ෂය 441 - ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඞ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා**

**වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 115,700,000 |
| මූලධන වියදම් | රු. 19,000,000 |

**වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 11,455,000,000 |
| මූලධන වියදම් | රු. 254,000,000 |

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 11,570,700,000 |
| මූලධන වියදම් | රු. 273,000,000 |
| **මුළු වියදම** | **රු. 11,843,700,000** |

(රුපියල් මිලියන එකොළොස් දහස් අටසිය හතලිස් තුනයි දශම හතයි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2021 ජූලි 19 දින ඉදිරිපත් කරන ලද 2021 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.
පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රු. 200,000,000,000.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2021 අගෝස්තු 05 බ්‍රහස්පතින්දා)**

1900/2021

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල හෝ කළමනාකරණ ප්‍රදේශවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය හෝ කළමනාකරණ ප්‍රදේශය එසේ රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1901/2021

ගරු අනුර දිසානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පරිසර අධිකාරිය යටතේ පවතින රක්ෂිතවල හෝ කළමනාකරණ ප්‍රදේශවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය හෝ කළමනාකරණ ප්‍රදේශය එසේ රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් හෝ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත අධිකාරිය යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1902/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1903/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1904/2021

ගරු අනුර දිසානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර, මහඔය, පොල්ලෙබැද්ද, ගල්වලයාය රක්ෂිත වනාන්තරයේ සිදු කරනු ලබන මහා පරිමාණ වන විනාශය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිත වනාන්තරය එළිපෙහෙළි කිරීමේදී පරිසර පනතට අනුව කටයුතු කරන ලෙස දන්වා තිබේද;

(ii) එසේ නම්, එම ලිපියේ පිටපතක් ලබා දෙන්නේද;

(iii) ඉහත වනාන්තරයේ එළිපෙහෙළි කරන ලද ප්‍රදේශ පරීක්ෂා කර තිබේද;

(iv) එම එළිපෙහෙළි කිරීමේදී පරිසර හානියක් සිදු වී තිබේද;

(v) එසේ නම්, සිදු වී ඇති පරිසර හානියේ ස්වභාවය කවරේද;

(vi) එම පරිසර හානිය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1905/2021

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහඔය මහවැලි නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය යටතේ ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් මේ වනතෙක් ජනතාවට බෙදා දී නොමැති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඊට අදාළ නිල ලේඛනය සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහඔය, පොල්ලේබැද්ද කෘෂි සංවර්ධන ව්‍යාපෘතියට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබා දී ඇති සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් සමාගමට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ඉඩම් අක්කරයක් විකුණන ලද හෝ බදු දෙන ලද මුදල කොපමණද;

(v) එමගින් අයකර ගෙන ඇති මුළු මුදල කොපමණද;

(vi) එම ඉඩම් ලබා දෙන ලද්දේ ගිවිසුම් අනුව නම් එම ගිවිසුම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) (ii) හි සඳහන් සමාගම් විසින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂි ව්‍යාපෘති කවරේද;

(ii) ඊට අදාළ ව්‍යාපෘති වාර්තා සභාගත කරන්නේද;

(iii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාළ ගිවිසුම් කොන්දේසි අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1907/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(ii) ඒ අතරින් මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(iii) මහඔය ගල්වලයාය ප්‍රදේශයේ වනාන්තරය, දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පැවති කාලය;

(iv) එම දෙපාර්තමේන්තුව විසින් ඉහත වනාන්තරය පාලනය කිරීම අත්හරින ලද දිනය සහ ඊට හේතු;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දෙපාර්තමේන්තුව විසින් ගල්වලයාය ප්‍රදේශයේ සිදු කර ඇති එක් එක් වන වගා ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වගා කරන ලද වනාන්තර මැන මායිම් ගල් යොදා තිබේද;

(iii) එසේ නම්, මායිම් ගල් යෙදූ වර්ෂය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගල්වලයාය ප්‍රදේශයේ වනාන්තර ඉඩම් අතරින් රජයේ රක්ෂිත ලෙස ගැසට් කිරීමට සැලසුම් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින්;

(ii) එම ඉඩම් ගැසට් කරනු ලබන දිනය;

(iii) එම ගැසට් කිරීම ප්‍රමාද වීමට හේතු;

කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2110/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසදීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2111/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2112/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුධ ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2113/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා

නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2114/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව වවුනියා දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2116/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම් සහා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව යාපනය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 සැප්තැම්බර් 23 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

67/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අපද්‍රව්‍ය කළමනාකරණය යන විෂයය, පළාත් සභා යටතට ගැනෙන විෂයයක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, පළාත් සභා ක්‍රමය ආරම්භයේ සිට මේ වනතෙක් සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම ආයතන ස්ථාපිත කර ඇති පළාත් සභාවල නම් කවරේද;

(ii) එවැනි විශේෂිත ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභාවල නම් කවරේද;

(iii) එවැනි ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභා සඳහා සුවිශේෂී ආයතනයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

199/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පවතින කැබිනට් අමාත්‍යාංශ සංඛ්‍යාව සහ රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම් ;

(iii) ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ රජයේ ගොඩනැගිලි වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

242/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වාහන අමතර කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වාහන අමතර කොටස් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එකී වාහන අමතර කොටස් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වාහන අමතර කොටස් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පානීය ජලය සපයන වැව්වල ජලයේ ගුණාත්මකභාවය පිරිහී ඇති බවත්;

(ii) E-coli ඇතුළු විෂබීජ අඩංගු වීම හේතුවෙන් එම ජලය ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පානීය ජලය ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන වැව්වල නම් කවරේද;

(ii) එම වැව්වල ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

519/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාලච්චේන ධීවර වරාය තුළ සාමාන්‍ය ට්‍රෝලර් යාත්‍රා හැසිරවිය හැකි වුවත්, විශාල ප්‍රමාණයේ ට්‍රෝලර් යාත්‍රා හැසිරවීම සඳහා එහි පිවිසුම සහ ගැඹුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දේශීය ධීවරයින් ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්;

(ii) එම ධීවර වරාය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර වරාය පුළුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

543/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවාගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් තනතුරු නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

671/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ඉදිකිරීම් ආරම්භ කරන ලද බිංගිරිය, කිණියම වාරි ව්‍යාපෘතියේ යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා ගත වන කාලය කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතිය මගින් පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

757/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) වන අලින්ගේ සංචරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) වන අලින් වැඩි වශයෙන් සංචරණය කරන ජාතික වනෝද්‍යාන හා රක්ෂිත වනාන්තර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අලි කොරිඩෝ තිබේ නම්, ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) අලි කොරිඩෝ හරස්වන ආකාරයට ගම්මාන හෝ ජනතාව පදිංචි ස්ථාන තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2020 සැප්තැම්බර් දක්වා දිස්ත්‍රික්කයේ අලි - මිනිස් ගැටුමෙන් —

(i) මියගිය පුද්ගලයන් හා වන අලින් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව;

(ii) හානි වී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iii) මියගිය හා දේපළ අහිමිවූවන්ට ගෙවා ඇති වන්දි මුදල එක් එක් පුද්ගලයා අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට ගත් නව ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

803/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිළි / වට්ටක්කච්චි මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇති බවත්;

(ii) එම පාසල සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන, මුදා නොහැරීම හේතුවෙන් ශ්‍රවණාගාරය ඉදිකිරීම මේ වනවිට නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය කවරේද;

(ii) එම ප්‍රතිපාදන, මුදා නොහැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

(iii) එහි ඉදිකිරීම් සම්පූර්ණ කර සිසුන්ගේ භාවිතය සඳහා ලබා දීමට ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

871/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝව සතු මේ වනවිට ධාවනයේ යෙදවීමට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව කොපමණද ;

(iv) මේ වනවිට එම එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ඩිපෝවල සේවය කරනු ලබන මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා හා එම ඩිපෝවල පවතින බස්රථ ඇණි වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 සැප්තැම්බර් 24 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

85/2020

ගරු හේෂා විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහවැලි කලාපවල දීර්ඝ කාලයක් පදිංචි වී සිටින ජනතාවගේ ඉඩම් සඳහා හිමිකම්පත් ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) දීර්ඝ කාලයක් ජනතාව පදිංචි වී සිටින වලව කලාපයේ සමහර ඉඩම් සඳහා හිමිකම්පත් ලබා දීමේදී එම ඉඩම් සඳහා තක්සේරු කර ඇති මුදල අසාධාරණ බව පිළිගන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iv) මහවැලි කලාපවල දීර්ඝ කාලයක් පදිංචි වී සිටින ජනතාවගේ ඉඩම් සඳහා සාධාරණ බදු මුදලක් මත හිමිකම්පත් ලබා දීම සඳහා ගතවන කාලය කොපමණද;

(v) ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතනවල ක්‍රියාකාරිත්වය සතුටුදායක මට්ටමක පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

282/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 - 2014 වකවානුව තුළ ශ්‍රී ලංකා යුද හමුදාවට කලාකරුවන් පිරිසක් විශේෂ පදනමක් මත බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, බඳවාගන්නා ලද දිනය හා තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ස්වෙච්ඡා සහ ස්ථිර යන බලසේනා අතරින් එම කලාකරුවන් බඳවාගෙන ඇති බලසේනාව කවරේද;

(ii) ඔවුන්ට හමුදා පුහුණුවක් ලබා දී තිබේ නම්, පුහුණු කාලය සහ පුහුණු කඳවුරේ නම කවරේද;

(iii) පුහුණුවෙන් පසු එම එක් එක් කලාකරුවාට පවරන ලද රාජකාරි, අනුයුක්ත කරන ලද රෙජිමේන්තුව, ගෙවන ලද වැටුප්, දීමනා හා වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත බඳවා ගැනීම නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට සම්බන්ධ පාර්ශ්වයන්ට එරෙහිව ගන්නා ලද හා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

308/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලැබූ ලාභය/ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ගෙවීමට තිබෙන රාජ්‍ය ආයතන, මණ්ඩල, සංස්ථා හා දෙපාර්තමේන්තු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එක් එක් රාජ්‍ය බැංකුව සඳහා ගෙවීමට ඇති ණය මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

465/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2018 හා 2019 දී පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ෂයේදී මුද්‍රණය කරන ලද පෙළපොත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එවකට අධ්‍යාපන අමාත්‍යවරයාගේ වර්ණ ඡායාරූපයක් එම පෙළපොත්වලට ඇතුළත් කර තිබුණේද;

(iv) එසේ නම්, එම ඡායාරූපය එම පෙළපොත්වල මුද්‍රණය කර පළ කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

755/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ—

(i) පදිංචිව සිටින නිවාස අවශ්‍යතා සහිත පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) දිස්ත්‍රික්කයේ පෞද්ගලික ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) ආදර්ශ ගම්මාන වශයෙන් ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

832/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ලද පළමු වර්ෂය කවරේද;

(ii) එම වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති මුළු සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iii) 2014.12.31 දින වනවිට ශ්‍රී ලංකාවට ලැබී තිබූ මුළු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2020 දක්වා ලැබී ඇති සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් ආයෝජන වටිනාකම එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

971/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සහ උප ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ නම් කවරේද;

(iii) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ මේ වනවිට පවතින ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රාදේශීය උප ඩිපෝව, 2001 වර්ෂයේදී උප ඩිපෝවක් බවට පත් කළ අතර එම ඩිපෝව මේ දක්වා උප ඩිපෝවක් ලෙසම පවතින බව එතුමා දන්නෙහිද?

(ii) එම උප ඩිපෝව, ප්‍රධාන ඩිපෝවක් බවට උසස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1365/2020

ගරු විජිත හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "සමන් කැකුල", ඇඹලව, දෙමටමළුව, කුරුණෑගල යන ලිපිනයේ පවත්වාගෙන යන ලද ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මනස්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ් යන මූල්‍ය ආයතනයේ කටයුතු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තහනම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනය තහනම් කිරීමට හේතු;

(ii) එහි ප්‍රධානියාගේ සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නම්;

(iii) එම ආයතනයේ ශාඛා තිබේ නම්, එවායේ නම්;

(iv) එම ආයතනය සහ එහි එක් එක් ශාඛාව සතු වත්කම් වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මුදල් සහ පොලිය අහිමි වීමෙන් එම ආයතනයේ තැන්පත්කරුවන් දැඩි පීඩනයකට පත්ව සිටින බවත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) තැන්පත්කරුවන්ගේ නම් සහ තැන්පත් මුදල වෙන් වෙන් වශයෙන්;

(ii) තැන්පත්කරුවන්ගේ මුදල් සහ පොලී නැවත ලබා දීමට ගෙන ඇති පියවර හා ඒ සඳහා ගතවන කාලය;

(iii) මේ සම්බන්ධ වැරදිකරුවන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1829/2021

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු ප්‍රමාදවීම මත නඩු ගොඩගැසීම හේතුවෙන් මහජනතාව පීඩාවට පත් වන බව පිළිගන්නේද;

(ii) උපදෙස් පතා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන නඩු සඳහා උපදෙස් ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2264/2021

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය, ගන්නොරුව ප්‍රදේශයේ මහවැලි ගඟ හරහා ඉදිකර ඇති සංගිලි පාලම අසල පේරාදෙණිය උද්භිද උද්‍යානයට ප්‍රතිවිරුද්ධ දිශාවට මුහුණලා මහවැලි ගඟ ආක්‍රමණය කර අනවසර හෝටලයක් ඉදිකරමින් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර අනිවත්ත ප්‍රදේශයේ දොඩංවල නව පාලමට වම්පස පිහිටා ඇති (අනිවත්ත සිට හල්ඔළුව මාර්ගයට පිවිසෙන විට) මහවැලි ගඟ රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් විශාල සංඛ්‍යාවක් සිදු කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) අනවසර ඉදිකිරීම් වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ඔක්තෝබර් 05 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

257/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගම් අතරින් පසුගිය වසර 03 තුළ නිවැරදිව විගණන වාර්තා ඉදිරිපත්කර ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(ii) එම සංගම්වල මූල්‍ය පාලනය විධිමත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනුලබන පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

283/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මානව පරිභෝජනයට සුදුසු අල වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම අල වර්ගවල ඇති පෝෂණ තත්ත්වය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iv) එම අල වර්ග අතර ඇති ඒක දේශික අල වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීය අල වර්ගවල පෝෂණ හා ඖෂධීය ගුණය ඉහළ බවත්;

(ii) වන විනාශය හා රසායනික පොහොර භාවිතය හේතුවෙන් එම අල වර්ග දුර්ලභ වී ඇති බවත්;

(iii) ඒ අතරින් ඇතැම් අල වර්ග මේ වනවිට වඳ වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දේශීය අල වර්ග ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) දේශීය අල වර්ග අපනයනය කිරීමට හා ඒ ආශ්‍රිත නිෂ්පාදන දියුණු කිරීමට සැලසුම් සකස් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

512/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා පාසල් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ජාතික පාසල් පද්ධතිය විධිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

616/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි සිට 2019 නොවැම්බර් දක්වා ආරක්ෂක මණ්ඩල රැස්වීම පවත්වා ඇති දින සංඛ්‍යාව කවරේද;

(ii) එම රැස්වීම් සඳහා සහභාගිවූවන්ගේ නම් කවරේද;

(iii) ආරක්ෂක මණ්ඩල රැස්වීම සඳහා නීත්‍යානුකූලව සහභාගිවීමට හිමිකම ඇති දේශපාලනඥයන් සහ නිලධාරින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැවති සම්ප්‍රදාය බිඳ හෙලමින් ඉහත කාලසීමාව තුළදී, විවිධ පුද්ගලයන් ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගි වී ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

764/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මඟින් අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කළ හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එකදු ජාතික පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) නව ජාතික පාසල් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iv) එම පාසල් ආරම්භ කිරීමේ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

792/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ පදිංචි වී සිටින ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට මාතලේ දිස්ත්‍රික්කයේ වගාබිම්වල ආක්‍රමණික ශාක පැතිරෙමින් පවතින බව දන්නේද;

(iii) එම තත්ත්වය මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන්ට හා ඔවුන්ගේ වගාබිම්වලට තර්ජනයක් බව දන්නේද;

(iv) මාතලේ දිස්ත්‍රික්කයේ වගාබිම්වල ආක්‍රමණික ශාක පැතිරීම වළක්වා ගොවි ජනතාව ආරක්ෂා කර ගැනීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

977/2020

ගරු වේලු කුමාර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති නකල්ස් කඳු වැටියේ නකල්ස් වන රක්ෂිතය සීමා මායිම්කර ඇති උස මුහුදු මට්ටමේ සිට අඩිවලින් කොපමණද;

(ii) එම සීමා මායිම් කර ඇති ප්‍රදේශයට ඇතුළත් වී ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නකල්ස් වන රක්ෂිතය ඇතුළත ජනපද තිබේද;

(ii) එම එක් එක් ජනපදයේ පදිංචි පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පවුල් සඳහා විකල්ප ඉඩම ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නකල්ස් වන රක්ෂිතය තුළ පෞද්ගලික ඉඩම් තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් වෙනුවෙන් විකල්ප ඉඩම් හෝ වන්දි හෝ ලබාදී තිබේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

989/2020

ගරු රෝහණ බංඩාර මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ පිහිටා ඇති මහජන පුස්තකාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුස්තකාලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම තනතුරු සඳහා නුසුදුසු පුද්ගලයන් බඳවා ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ii) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1202/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද උප තැපැල් ස්ථානාධිපතිවරුන් 1996 වර්ෂයේ සිට රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බවත්;

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව හා 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද නව බඳවාගැනීමේ පටිපාටිය අනුව මෙම පිරිස කළමනාකරණ සහකාර සේවයේ - II ශ්‍රේණියට බඳවාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කළමනාකරණ සේවයේ සහකාර - II ශ්‍රේණියේ තනතුරුවල සේවය කරනු ලබන අනෙකුත් නිලධාරින්ට හා තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන අනෙකුත් නිලධාරින්ට ලබා දෙනු ලබන ප්‍රසූත නිවාඩු, වාර්ෂික නිවාඩු, අතිකාල දීමනා සහ කාර්යාල පහසුකම් ආදී වරප්‍රසාද ඉහත (අ) (ii) හි සඳහන් නිලධාරින්ට ලබා නොදීමට හේතු;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1863/2021

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැවිලි මානව සංවර්ධන භාරය විසින් වතු කම්කරුවන්ගේ සුභසාධානය වෙනුවෙන් ඉටු කරනු ලබන කාර්යභාරය කවරේද;

(ii) එම ආයතනය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාර්යාල පිහිටුවා ඇති ප්‍රදේශවල නම් කවරේද;

(iv) එම එක් එක් ප්‍රාදේශීය කාර්යාලයක් විසින් සේවා සපයනු ලබන වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා එම එක් එක් ප්‍රාදේශීය කාර්යාලයක් විසින් ක්‍රියාත්මක කරන ලද එක් එක් ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා එක් එක් ප්‍රාදේශීය කාර්යාලය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය කාර්යාලක් විසින් සේවා සපයනු ලබන වතු කම්කරුවන් සංඛ්‍යාවට සාපේක්ෂව සාධාරණව බෙදී ගොස් ඇති බව සහතික කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ඔක්තෝබර් 06 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

285/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම-මුණසිංහ සමාගමට අයත් ඉඩම් අක්කර 12ක් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයට පවරාගෙන ඇති බවත්;

(ii) එහිදී ඉඩම් අක්කරයක් සඳහා රු. 8,000,000/- ක් ගෙවා ඇති බවත්;

(iii) එම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේ පවරාගත් කුරුණෑගල-මාදම්පේ ප්‍රධාන පාරට යාබදව පිහිටා ඇති ඉඩම සඳහා ගෙවා ඇත්තේ අක්කරයකට රු.2,000,000/- ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (i) හි සඳහන් ඉඩම පවරා ගැනීමේදී අක්‍රමිකතාවයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එයට සම්බන්ධ පාර්ශ්වයන්ට එරෙහිව පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉඩම පවරා ගැනීමට ආසන්න කාලයේදී විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරිවරයා සහ ලේඛකාධිකාරිවරයා සති දෙකක විදේශ සංචාරයක යෙදී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එයට අනුමතිය ලබා දී තිබේද;

(iii) අනුමතිය ලබා දී ඇති පාර්ශ්වය කවරේද;

(iv) එම සංචාරයේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු කවරේද;

(v) එම සංචාරයට රජයේ මුදල් වෙන් කළේද;

(vi) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

309/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන සභාපතිවරයාගේ නම කවරේද;

(ii) එම සභාපතිවරයා විසින් මීට පෙර දරන ලද තනතුරු කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සංස්ථාවල සහ මණ්ඩලවල තනතුරු සඳහා පත් කිරීමේදී, විද්වත් කමිටුවක් විසින් සුදුසු පුද්ගලයන් තෝරා ගනු ලබන බවට රජය විසින් ප්‍රතිඥාවක් ලබා දී තිබෙන බව එතුමා දන්නේද;

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්තමාන සභාපතිවරයාගේ පත් කිරීම ඉහත ප්‍රතිඥාවට අනුකූල වන්නේ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

513/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති බෞද්ධ විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවයේ නම් කවරේද;

(iii) එම විශ්වවිද්‍යාල අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලනය යටතට ගැනීමට තීරණය කර තිබේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

(v) ශ්‍රී ලංකාවේ බෞද්ධ විශ්වවිද්‍යාලවල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

617/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙංගු මදුරු උවදුර මර්දනය කිරීම සඳහා ඩෙංගු කීට මර්දන සහායකයන් බඳවා ගනු ලැබූ බව දන්නේද;

(ii) එසේ නම්, එසේ බඳවා ගනු ලැබූ ඩෙංගු කීට මර්දන සහායකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ඔවුන් සේවය අතහැර ගොස් තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

765/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දේශීය රෙදිපිළි කර්මාන්තය දියුණු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ශක්තිමත් කළ හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පවතින අත්යන්ත්‍ර පේෂ කර්මාන්තශාලා අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලා නැවත ආරම්භ කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1416/2021

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ මූලික රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලය යටතේ පවතින තිරුක්කෝවිල් රෝහල සඳහා මේ වනතෙක් අවශ්‍ය සම්පත් නිසි පරිදි ලබා දී නොමැති බවත්;

(ii) එම රෝහලේ ප්‍රසව හා නාරිවේද ඒකකය සඳහා අවශ්‍ය පහසුකම් නොමැති වීම හේතුවෙන් ගර්භනී මව්වරුන් විවිධ අපහසුතාවයන්ට පත්වන බවත්;

(iii) එම රෝහලේ සේවක පුරප්පාඩු පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ නම්, එම රෝහලට අවශ්‍ය සම්පත් හා පහසුකම් ලබා දෙනු ලබන දින වකවානු කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1431/2020

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ හබරණ නගරය කේන්ද්‍ර කර ගනිමින් සංචාරක කලාපයක් ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) එම කලාපයට අයත් වනාන්තර සහ එම කලාපය තුළ සැරිසරන වන අලින් ආරක්ෂා වන ආකාරයෙන් එම සංචාරක කලාපයේ භෞතික සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එවැනි අධ්‍යයනයක් තුළින් විධිමත් හා විද්‍යානුකූල ලෙස දියුණු කරන ලද සංචාරක කලාපයක් ලෙස හබරණ නගරය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(iv) එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සැලසුම් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1438/2021

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පොලිස් ස්ථාන සංඛ්‍යාව හයසීයක් දක්වා වැඩිකිරීම සඳහා වූ යෝජනාවක් පසුගිය රජය කාලයේදී ඉදිරිපත් කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ යටතේ අලුතින් ඉදිකරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථාන අතරින් මේ වනවිට විවෘත කර ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට විවෘත කරන ලද පොලිස් ස්ථාන වර්ගීකරණය කර ඇති ශ්‍රේණි කවරේද;

(iv) විවෘත කිරීමට ඉතිරිව ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(v) එම පොලිස් ස්ථාන අතරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වන පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ඔක්තෝබර් 07 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

289/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුලත් සඳහා පාකිස්ථානය වැනි රටවල්වලින් විශාල ඉල්ලුමක් පවතින බවත්;

(ii) අපනයන බෝගයක් ලෙස බුලත් ව්‍යාප්ත කිරීමට සුදුසු පරිසරයක් ශ්‍රී ලංකාවේ පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) බුලත් වගාව ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කිරීම සඳහා මේ වනවිට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015 හා 2016 යන වර්ෂවලදී බුලත් අපනයනය කිරීමෙන් ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බුලත් අපනයනය කිරීමෙන් ලබන ආදායම ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

311/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ලෝක වෙළඳපොළේ බනිජ තෙල් මිල ඉහළ ගිය සහ පහළ ගිය අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මිල වෙනස්වීම්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ බනිජ තෙල් මිල සංශෝධනය කිරීමට ගනු ලැබූ පියවර කවරේද;

(iii) ලෝක වෙළඳපොළේ බනිජ තෙල් මිල පහළ යාමේ වාසිය, ශ්‍රී ලංකාවේ පාරිභෝගික ජනතාව වෙත ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

466/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ උත්පාදනය වූ නව රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2014 වර්ෂයට සාපේක්ෂව ඉහත කාලය තුළදී සිදු වූ විරැකියා අනුපාතයේ වෙනස කවරේද;

(iv) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ දිගුකාලීන නිෂ්පාදන ධාරිතාවයේ සිදු වූ වෙනස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

514/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට උප කුලපතිවරු පත් කිරීම සම්බන්ධයෙන් නව චක්‍රලේඛයක් නිකුත් කර තිබේද;

(ii) එම චක්‍රලේඛය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අතර යම් මතභේදයක් පැන නැගී තිබේද;

(iii) එම චක්‍රලේඛය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

644/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, කළුතර, ගම්පහ සහ රත්නපුර යන දිස්ත්‍රික්ක ගංවතුරෙන් ආරක්ෂාකර ගැනීම සඳහා මේ වනවිට සකස් කර ඇති සැලසුම් කවරේද;

(ii) එම ප්‍රදේශ ගංවතුරෙන් ආරක්ෂාකර ගැනීම සඳහා වෙනත් යෝජනා පවතී නම්, එම යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

649/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන මැතිවරණ කොට්ඨාසයේ පිහිටා ඇති වටරැක, හීන්පැන්දල, කලේගාන, මාම්පිටිය යන ප්‍රදේශවල ජීවත්වන ජනතාවගෙන් 80% පමණ තම ජීවන වෘත්තිය ලෙස කැටයම් ශිල්පයේ නිරතවන බවත්;

(ii) කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරක කර්මාන්තයේ බිඳවැටීම, එම කැටයම් ශිල්පීන්ට අහිතකර ලෙස බලපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කය තුළ පදිංචි තම ජීවන වෘත්තිය ලෙස කැටයම් ශිල්පයේ නිරතවන කර්මාන්තකරුවන් සංඛ්‍යාව ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කැටයම් ශිල්පීන්ගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

948/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය සභා බලප්‍රදේශයක් වන නෙඩුන්තීවු දූපතේ ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වන්නේ මුහුදු මාර්ගය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දූපතේ ක්‍රියාත්මක වන ''නෙඩුන්තාරකෙ'' නැමැති මගී යාත්‍රාවේ සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ තනතුර, පත්වීම් දිනය සහ සේවා පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් නිලධාරීන්ට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දී ඇත්තේ කවුරුන්ද;

(ii) විලියම් යේසුදාසන්, ඇන්ටනී රාජ්, සින්දාකුලම් මෙල්කියාස් මිලන්, ඇල්ෆ්‍රඩ් මරියදයාලන්, ඇන්ටනි අමලදාසන්, ඇන්ඩෘස් රකීම්ලයෝන් යන නිලධාරීන්ට, ඔවුන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් මත ස්ථිර පත්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම ස්ථිර පත්වීම් ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

988/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ නගරයේ ඇතැම් ප්‍රදේශවලට කේබල් යොදා ගනිමින් විදුලි සම්බන්ධතාවය ලබා දෙනු ලබන බවත්;

(ii) එම සම්බන්ධතාවය ලබා දීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් අධික මුදලක් අය කරනු ලබන බවත්;

(iii) එම මුදල, අඩු ආදායම්ලාභී සහ මධ්‍යම පාන්තික පවුල්වලට දරා ගැනීමට අපහසු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අඩු ආදායම්ලාභීන්ගේ සහ මධ්‍යම පාන්තිකයන්ගේ නිවාස සඳහා සහන මිලට විදුලි සම්බන්ධතාවය ලබා දීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) නොඑසේ නම්, ඔවුන්ට සහන මිලකට විදුලි සම්බන්ධතාවය ලබා දිය හැකි විකල්ප ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1403/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළදී මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන කොටසේ දුර ප්‍රමාණය;

(ii) එම දිග ප්‍රමාණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෙර පැවති රජය විසින් සැලසුම් කර තිබූ පරිදි මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජල ගැලීම් සිදු වෙතැයි අපේක්ෂා කරනු ලබන ස්ථානවලදී පෙර සැලසුම් කරන ලද පරිදි කණු මතින් මෙම මාර්ගය ඉදිකරන්නේද;

(ii) සැලසුම් කරන ලද පරිදි මේ වනවිට මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1830/2021

ගරු චාමර සම්පත් දසනායක මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා ගෙවනු ලබන මාසික වැටුපට අමතරව පසුගිය රජයේ ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දීමනාවක් ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම දීමනාව කොපමණද;

(iii) එම ගෙවීම සඳහා නීත්‍යානුකූල පදනමක් තිබේද;

(iv) ඉහත දීමනාව ගෙවන ලද අමාත්‍යාංශයේ/කාර්යාලයේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා ඉහත දීමනාව ගෙවීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ඔක්තෝබර් 08 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

292/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2019දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

312/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ලැබී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති අතරින් අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) අනුමත කරන ලද ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ ආරම්භ කර ඇති හා වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද?

(v) මේ වනවිට වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

672/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පීඨවල නම් කවරේද;

(iii) එම එක් එක් පීඨයේ පවත්වනු ලබන පාඨමාලාවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මේ වනවිට එම විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

(vi) එම විශ්වවිද්‍යාලය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

743/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රත්මල්ගහවැව හන්දියේ සිට කිවුලේකඩ හන්දිය දක්වා වූ කි.මී. 10ක් පමණ දිගින් යුතු මාර්ග කොටස ඉතා අබලන් තත්ත්වයේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එම මාර්ග කොටසේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

756/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ —

(i) පළාත් සභා පාලනය යටතේ පවතින පාසල්වල ගොඩනැගිලි සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම්;

(ii) එම පාසල්වල ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

934/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, මුල්ලියාවලයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් 22ක් ආවරණය වන තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන බවත්;

(ii) ඒ සඳහා රු. 20,000/- ක මාසික කුලියක් ගෙවන බවත්;

(iii) එම තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර දෙන ලෙස ජනතාව සහ පොදු සංවිධාන විසින් ඉල්ලීම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) මුල්ලියාවලයි ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් ගුණාත්මක තැපැල් සේවයක් ලබා දීම සඳහා ඉහත තැපැල් කාර්යාලය වෙනුවෙන් ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ල ඉදිකරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1064/2020

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කල්පිටිය අර්ධද්වීපය තුළ දෙළුම් වගා කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට එහි දෙළුම් වගා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එහි දෙළුම් වගාවේ නිරතවන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිසි පරිදි තාක්ෂණික දැනුම නොලැබීම හා නිෂ්පාදන අලෙවි කර ගැනීමට අපහසු වීම වැනි ගැටලු එම ගොවීන්ට ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1109/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල, පැල්ලන්දෙණිය ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ඉයෝන් ලංකා මූල්‍ය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය යටතට පත්කර තිබේද;

(ii) එම ආයතනයේ මුදල් තැන්පත්කරුවන් අතරින් වැඩි ප්‍රමාණයක් විශ්‍රාමික රණවිරුවන් බව දන්නේද;

(iii) එම ආයතනයේ මුදල් තැන්පත් කර ඇති තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම තැන්පත්කරුවන්ගේ තැන්පත් මුදල්, නැවත ඔවුන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1281/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර හෝ තාවකාලික නිවාසවල පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව;

(ii) එම පදිංචිකරුවන්ගෙන් ඔප්පු හෝ බලපත්‍ර ලබාදී ඇති සංඛ්‍යාව;

(iii) ඉහත (ii) හි ඉඩම් අතරින් ඉඩම් අමාත්‍යාංශය සතු ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඔප්පු හෝ බලපත්‍ර ලබා දී නොමැති ඉඩම්වල, ස්ථිර හෝ තාවකාලික නිවාස ඉදිකර ඒවායේ පදිංචි වී සිටින පවුල් ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පවුල් පදිංචි වී සිටින ඉඩම් අතරින් ඉඩම් අමාත්‍යාංශය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) බලපත්‍ර නොමැති ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම බලපත්‍ර ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1336/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත සමෘද්ධි සංවර්ධන නිලධාරීන්;

(ii) එම දිස්ත්‍රික්කයේ මේ වනවිට සේවය කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්;

(iii) ඒ අනුව පවතින පුරප්පාඩු;

(iv) එම දිස්ත්‍රික්කයේ මුළු සමෘද්ධි ප්‍රතිලාභීන්;

(v) එම දිස්ත්‍රික්කයේ පසුගිය රජය විසින් සමෘද්ධි සහනාධාර ලබා දෙන ලද නව සමෘද්ධි ප්‍රතිලාභීන්;

සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන නිර්ණායක කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?